# බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රීඩා හා විනෝද සමාජයේ ව්‍යවස්ථාව



# බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රීඩා හා විනෝද සමාජයේ
# ව්‍යවස්ථාව

(01) හැඳින්වීම :- බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රීඩා සමාජය 1937 ජූනි මස 19 වන දින ආරම්භ කළ අතර දැනට පවතින ව්‍යවස්ථාව එම අවස්ථාවේදි නිර්මාණය කරන ලදි. ක්‍රීඩා ඇමතිතුමාගේ නව හඳුන්වාදීම් හා වෙනස් කිරීම් ජාතික තරඟ සඳහා අවශ්‍යවන පරිදි හා ව්‍යවස්ථාවට අවශ්‍ය පරිදි වෙනස්කම් සිදුකරමින් බන්ධනාගාර ක්‍රීඩා සමාජය එහි පරිපාලන සංයුතියේ වෙනස් කිරීම් සිදු කල අතර 2010 ජූනි මස 19 වන දින සිට ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාව, 2022 මැයි මස 22 වන දින සංශෝධන කිහිපයක් සිදුකර නැවත ස්ථාපනය කරන ලදි.

(02) නම :- ක්‍රීඩා සමාජය හඳුන්වා දී ඇත්තේ
**"බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රීඩා හා විනෝද සමාජය"**

(03) අරමුණ :- ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් ක්‍රීඩාවට යොමු කිරීම තුලින්, ඔවුන්ගේ ක්‍රියාශීලි බව, සෞඛ්‍යය සම්පන්න බව සහ මානසික සුවය, නිලධාරීන්ගේ සුභසාධනය සැලසීම මගින් ඕනෑම ක්‍රීඩාවක් සංවිධානය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කර වීම. එසේම බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුල ඕනෑම ක්‍රීඩාවක් ප්‍රචලිත කිරීම සඳහා හැකි සෑම සහයෝගයක්ම ලබාදීම. එසේම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අනන්‍යතාව හා නිලධාරීන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම.

(04) <u>ක්‍රීඩා සංගමයේ ධජය</u>

වර්ණ :- ක්‍රීඩා සංගමයේ වර්ණය විය යුත්තේ මෙරූන් වර්ණය, නිල් වර්ණය හා ග්‍රේ වර්ණය වේ. මෙරූන් වර්ණය අඩි 03 ක්ද, නිල් වර්ණය අඩි 01 ක්ද, ග්‍රේ වර්ණ අඩි 01 ක් බැගින් ද විය යුතු අතර ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ලාංඡනය මෙම ධජයේ මෙරූන් වර්ණයේ මධ්‍ය ලක්ෂයේ පිහිටා තිබිය යුතුය.

ක්‍රීඩා සමාජයේ නම :- Prison Department Recreation Club යනුවෙන් පහල කොටසේ සඳහන් විය යුතුය.

ධජයේ ප්‍රමාණය :- දිග අඩි 05 ක් සහ පළල අඩි 03 ක් විය යුතුය.

(05) <u>සාමාජිකත්වය</u>

5:1 සමාන්‍ය සාමාජිකත්වය : බන්ධනාගාර සේවයේ නියුතු සෑම සාමාජිකයකුම තම සේවා කාලය තුල මෙම සමාජයේ නිත්‍ය සාමාජිකයෙකු වේ.

5:2 යාවජීව සාමාජිකත්වය : මෙම යාවජීව සාමාජිකත්වය ප්‍රධානය කිරීම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට විවෘතව ඇති අතර ක්‍රීඩා සාමාජයේ දැනට සිටින හෝ විශ්‍රාමික ඕනෑම දෙපාර්තමේන්තු සේවකයෙකුට ක්‍රීඩාව වෙනුවෙන් කමා කරන ලද සුවිශේෂී වූ සේවය උදෙසා බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි යාවජීව සාමාජිකත්වය ලබා දිය හැක.

5:3 ගරු සාමාජිකත්වය : විශ්‍රාමික බන්ධනාගාර නිලධාරියකුට හෝ වෙනත් විදේශ රටක සිට පැමිණි ආගන්තුක බන්ධනාගාර නිලධාරියකුට අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි ගරු සාමාජිකත්වය ලබාදිය හැක.

5:4 **අනුබද්ධ සාමාජිකත්වය :** බන්ධනාගාර සේවයේ ඒකාබද්ධ සේවයේ නියුතු වූවන්ගේ ඉල්ලීම පරිදි අනුබද්ධ සමාජිකත්වය ලබා දිය හැකිය. මෙම අනුබද්ධ සාමාජිකයින් ක්‍රීඩා සමාජයේ ඡන්දය දීම සඳහා වලංගු නොවූවත් ඔවුනට, ඔහුට හෝ ඇයට විධායක සභාවේ අනුමැතිය ඇතිව ඕනෑම ක්‍රීඩාවක් සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව නියෝජනය කල හැකිය.

(06) **සමාජිකත්වය ඉවත්කිරීම. :** බන්ධනාගාර සේවය අවසන්වන නිලධාරියෙකුගේ සාමාජිකත්වය එම අවස්ථාවේ අවසන් වේ. වැඩ තහනමට යටත්ව සිටින නිලධාරියකුට ක්‍රීඩා සමාජයේ කිසිදු පහසුකම් නොලැබෙන අතර මෙය වැඩ තහනමට ලක්ව සිටින කාලයට පමණක් වලංගුවේ. සංගමයේ තනතුරක් දරණ සාමාජිකයකු වැඩ තහනමකට ලක්වී ඇත්නම් එම කාලය තුල එම තනතුරේ කටයුතු කිරීම තහනම් වන අතර එම පුරප්පාඩුව තාවකාලිකව පිරවිය යුතුය. යාවජීව සාමාජිකයෙකු හෝ ගරු සමාජිකයකුගේ සාමාජිකත්වය ඔහුගේ හෝ ඇයගේ මරණයෙන් පසු බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ ලිපියක් මගින් ඉවත්කල හැකිය.

(07) **සාමාජිකත්වය අත්හිටුවීම. :** බන්ධනාගාර ක්‍රීඩා සමාජ විනය කමිටුව මගින් සාමාජිකයකුගේ සාමාජිකත්වය අත්හිටුවිය හැකි අතර ක්‍රීඩා සමාජය මගින් පිරිනැමෙන පහසුකම් හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රීඩා සමාජය නියෝජනය කිරීම, ඕනෑම ක්‍රීඩාවක් සඳහා විනය කරුණු මත අත්හිටුවිය හැකිය.

(08) **නිලධාරීන් මණ්ඩලයක් පත්කර ගැනීම :** නිලධාරීන් මණ්ඩලය සමන්විතවනුයේ ගරු සභාපති, ගරු උප සභාපතිවරුන්, ගරු ප්‍රධාන ලේකම්, ගරු උප ලේකම් ගරු භාණ්ඩාගාරික, ක්‍රීඩා පිටිය භාර ලේකම්, , විවිධ ක්‍රීඩාවල සභාපතිවරුන් හා ලේකම්වරුන්ගෙන්ද, අවන්හල් කළමණාකරු, ගිණුම් පරීක්ෂකවරුන්ගෙන් සමන්විත වනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ගරු සභාපති - | බන්ධනාගාර කොමසාරිස් ජනරාල් නිල බලයෙන් |
| (ආ) | ගරු උප සභාපතිවරුන් - දෙදෙනෙකු | බන්ධනාගාර කොමසාරිස්වරුන් අතරින් දෙදෙනෙකු යෝජනා ස්ථිරත්වයෙන් පත්කර ගත යුතු වේ. |
| (ඇ) | ගරු ප්‍රධාන ලේකම් - | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරීන් අතුරින් නිළධාරියෙකු යෝජනා ස්ථිරත්වයෙන් පත් කළ යුතුය. |
| (ඈ) | ගරු උප ලේකම් - | මහ සභාවකදී යෝජනා ස්ථිරත්වයෙන් නිලධාරියෙකු පත්කර ගත යුතුවේ. |
| (ඊ) | ගරු භාණ්ඩාගාරික - | බන්ධනාගාර අධිකාරිවරයෙකු හෝ සහකාර අධිකාරිවරයෙකු මහා සභා රැස්වීමේදී තෝරාපත් කර ගත යුතුවේ. |
| (ඉ) | අවන්හල් කළමණාකරු - | මහා සභා රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සුදුසු නිලධාරියෙකු පත්කර ගත යුතුය. |
| (උ) | ගිණුම් පරීක්ෂකවරු - | ගිණුම් පරීක්ෂකවරු දෙදෙනෙක් මහා සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් පත්කරගත යුතු වේ. ජේලර් තනතුරෙන් ඉහල නිළධාරීන් විය යුතුය. |
| (ඌ) | වැලිකඩ ක්‍රීඩාපිටිය භාර ලේකම් } | පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයෙහි ජේලර්වරයෙක් නිළබලයෙන් |

(එ) සෑම ක්‍රීඩාවක් සඳහා සභාපතිවරු පත් කිරීම බන්ධනාගාර අධිකාරි/ සහකාර අධිකාරි/ 1 පෙළ ජේලර්ගෙන් ඉහල නිලධාරීන් යෝජනා ස්ථිරත්වයෙන් පත්කළ යුතුය.

(ඒ) සෑම ක්‍රීඩාවක් සඳහාම එක් එක් ක්‍රීඩා ලේකම්වරයෙකු බැගින් වාර්ෂික මහා සභා රැස්වීමේදී තෝරා පත්කල යුතු අතර අවන්හල සඳහා භාරකරුවකු ද සෙසු නිලයන්ගෙන් වාර්ෂික මහා සභා රැස්වීමේදී තෝරා පත්කල යුතුය.

(ඔ) ඉහත සියළු තනතුරුවල නිලකාලය ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම දක්වා වලංගු වන අතර මෙම වාර්ෂික සභාවාරයන් දෙක තුල යම් පුරප්පාඩුවක් හා තනතුරකින් ඉවත් කිරීමක් වෙතොත් එම තනතුර මධ්‍යම කමිටුව විසින් පිරවිය යුතුය. යම් තනතුරක් සඳහා එක් අයෙකුට වඩා ඉදිරිපත් වන්නේ නම් ඡන්දයකින් තෝරා පත්කර ගත යුතුය.

(ඕ) මව් සංගමයෙන් පත්කරනු ලබන නිලධාරීන් දෙදෙනෙකු විසින් ප්‍රාදේශීය සංගම් අධීක්ෂණය කල යුතුය.

(09) පරිපාලනය : ක්‍රීඩා සමාජයේ සියළුම කටයුතු සඳහා මග පෙන්වීම විධායක කමිටුව මඟින් සිදු කල යුතුය. විධායක කමිටුවට සහාය වීම මධ්‍යම කමිටුව මගින් සිදු කරන අතර මෙම මධ්‍යම කමිටුව සෑම ක්‍රීඩාවකටම අවශ්‍ය පහසුකම් සැපයීමේ අවස්ථා සඳහා සක්‍රියව දායක විය යුතුය.

(10) <u>විධායක කමිටුව</u>

10:1 <u>විධායක කමිටුවේ සාමාජිකත්වය</u>

(අ) ගරු සභාපති
(ආ) ගරු ප්‍රධාන ලේකම්
(ඇ) ගරු භාණ්ඩාගාරික
(ඈ) ගරු උප සභාපතිවරු
(ඉ) ගරු උප ලේකම්

10:2 <u>විධායක කමිටුවේ බලතල හා කාර්යභාරය වනුයේ</u>

(අ) ක්‍රීඩා සමාජයේ සාමාජිකයින්ට බැඳී පවතින නීති සම්පාදනය වෙනස් කිරීම හෝ ඉවත් කිරීම.

(ආ) ක්‍රීඩා සමාජයේ ව්‍යවස්ථාවේ සඳහන් සෑම කරුණක් සම්බන්ධයෙන්ම ඇතුලත් නීති තීරණය කිරීම සහ පැහැදිලි කර ඉදිරිපත් කිරීම.

(ඇ) ක්‍රීඩා සමාජයේ අරමුණු සඳහා වූ මුදල් අයකර ගැනීම්, සාමාජික මුදල් යෙදවීම් පිළිබඳ පැහැදිලි කරදීම.

(ඈ) ඕනෑම තරඟාවලියක් හෝ තරඟයක් හෝ ඉදිරිපත්වීමක් පිළිබඳ ක්‍රීඩා සමාජයේ නියෝජනය පිළිබඳ තීරණ ගැනීම.

(ඉ) සෑම ක්‍රීඩාවක් සඳහාම නායකයින් පත්කිරීම.

(ඊ) බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රීඩා සමාජයේ ක්‍රීඩා කණ්ඩායම්වල විදේශ සංචාර සඳහා වූ කණ්ඩායම් කළමණාකරුවන් පත් කිරීම.

(උ) ඕනෑම කරුණක් සඳහා විධායක කමිටුව විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

(ඌ) කණ්ඩායම් තරඟයක් හෝ තනි පුද්ගල තරඟයක් ජයග්‍රහණය වෙනුවෙන් සහතික නිකුත් කිරීමේ බලය කමිටුව සතුවේ.

(එ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කීර්ති නාමය හා අනන්‍යතාවය වර්ධනය කිරීම නිළධාරීන්ගේ සුභසාධනය සඳහා අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

(11) <u>මධ්‍යම කමිටුව සමන්විත වනුයේ</u>

(අ) සියළුම විධායක කමිටු සාමාජිකයින්ගෙන්
(ආ) සියළුම ක්‍රීඩා ඉසව්වල සභාපතිවරුන් සහ ලේකම්වරුන්ගෙන්
(ඇ) ක්‍රීඩා පිටිය භාර ලේකම්

11:1 <u>මධ්‍යම කමිටුවේ ක්‍රියාකාරිත්වය නම්</u>

(අ) බන්ධනාගාරයේ ක්‍රීඩා පිළිබඳව ව්‍යවස්ථානුකූලව උපදෙස් දීම සහ පවත්වාගෙන යාම.

(ආ) අවුරුද්දක් සඳහා වූ ක්‍රීඩා ඉසව් සඳහා තරඟ සහ අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා සැලසුම් කාල සටහන් ඉදිරිපත් කිරීම.

(ඇ) විනිසුරුවන්, පුහුණුකරුවන් සඳහා වූ පුහුණු සැසි සංවිධානය කිරීම.

(ඈ) පුහුණුකරුවන් පත් කිරීම හා ඔවුන් සඳහා කඳවුරු පැවැත්වීම.

(ඉ) සාමාජිකයින්ගෙන් ලැබිය යුතු මුදල් පිළිබඳව සහ මාසික වාරික තීරණය කිරීම.

(ඊ) බන්ධනාගාර ක්‍රීඩාපිටි පාලනය කිරීම සහ බදුදීම පිළිබඳව කලින් කලට මිල තීරණය කිරීම.

(උ) ක්‍රීඩා සමාජයේ සේවයේ නියුතු සේවකයින් පිළිබඳව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම, වැඩ තහනම් කිරීම සහ ඔවුන්ගේ වේතන සහ දීමනා තීරණය කිරීම.

(ඵ) සෑම වියදමක්ම මධ්‍යම කමිටුව මගින් අනුමත කල යුතු අතර සෑම ක්‍රීඩාවක් සඳහාම වූ වියදම් පාලනය මධ්‍යම කමිටුව මගින් සිදු කල යුතුය.

(ඒ) වාර්ෂික සැලසුම් කාලසටහනට අනුව විවිධ ක්‍රීඩාවන්හි ක්‍රියාකාරිත්වයක් නොමැති නම් එම ක්‍රීඩා ඉසව්ව සඳහා වූ සභාපති සහ ලේකම් වගකිව යුතු අතර මීලඟ වාර්ෂික සභාවාරයේදී අවශ්‍ය නම් එම ක්‍රීඩාව ක්‍රීඩා සමාජයේ ක්‍රීඩා ලයිස්තුවෙන් ඉවත් කල යුතුය.

(ඔ) අනුබද්ධ ආයතනවල ක්‍රියාකාරිත්වය සොයා බලා අදහස් විමසීමද කල යුතුය.

(ඕ) අවන්හලේ පූර්ණ පරිපාලනය පිළිබඳව කටයුතු කිරීම.

(12) <u>ක්‍රීඩා කමිටු</u>

(අ) අදාල ක්‍රීඩා ඉසව්ව ප්‍රචලිත කිරීම සහ සංවිධානය කිරීම සඳහා පත්කල කමිටු වේ.

(ආ) සෑම ක්‍රීඩා කමිටුවක් සඳහා විධායක කමිටුව මඟින් එම ක්‍රීඩාව සඳහා පත් කරන ලද සභාපති, කණ්ඩායම් නායකයෙකු සහ මහා සභාව මඟින් පත්කරන ලද අදාල ක්‍රීඩා ලේකම්ගෙන් සමන්විත වේ.

12:1 <u>ක්‍රීඩා කමිටුවල ක්‍රියාකාරිත්වය වනුයේ</u>

(අ) අදාල ක්‍රීඩාව සඳහා අවශ්‍ය සියළු පහසුකම් ලබාදීම.

(ආ) ක්‍රීඩා කමිටු ලේකම් විසින් තම කමිටුවේ අවශ්‍යතා පිළිබඳ ලේඛණයක් මධ්‍යම කමිටුව වෙත ඔවුන්ගේ තීරණ සඳහා ඉදිරිපත් කල යුතුය.

(ඇ) සෑම ක්‍රීඩා කමිටුවකම ලේකම් විසින් මැයි මස 15 වැනිදාට පෙර ජූනි 01 සිට මාස 12 ඉදිරියට වූ ක්‍රීඩා සැලසුම් පිළිබඳ සැලසුම් කාල සටහනක් හා වාර්තාවක් මධ්‍යම කමිටුව වෙත ඉදිරිපත් කල යුතුය.

12:2 <u>ක්‍රීඩා කමිටු ලේකම්ගේ වාර්ථාව සමන්විත විය යුත්තේ</u>

(අ) තරඟාවලි සහ තරඟ පිළිබඳ සහ බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රීඩා සමාජය ඉදිරිපත්වීම පිළිබඳ ලයිස්තුවක්

(ආ) පුහුණුවීම් හා පුහුණු කිරීම පිළිබඳ විස්තර වාර්තාවක්

(ඇ) ඉදිරි කැලැන්ඩර් වර්ෂයක් සඳහා අදාල ක්‍රීඩා කමිටුවට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන පිළිබඳ සවිස්තර වාර්තාවක්

(ඈ) සෑම ක්‍රීඩා කමිටු ලේකම්වරයෙකු විසින්ම ඉදිරි මාස 12 ක කාලය සඳහා අපේක්ෂිත වියදම් වාර්තාවක් මධ්‍යම කමිටුවට ඉදිරිපත්කල යුතු අතර වාර්ෂික නිලවරණයෙන් මසකට පසුව මේ පිළිබඳ සමාලෝචනයක් ඉදිරිපත් කල යුතුය.

(13) **ක්‍රීඩා තේරීම් කමිටුව :** බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රීඩා සමාජය සඳහා වූ එක් එක් ක්‍රීඩා කණ්ඩායම් සඳහා ක්‍රීඩකයින් තෝරා බඳවා ගැනීම මෙම කමිටුව මඟින් සිදුකරන අතර අදාල ක්‍රීඩා කමිටුව බන්ධනාගාර ක්‍රීඩා සමාජයේ ප්‍රධාන ලේකම්වරයා, අදාල ක්‍රීඩාවේ සභාපති, ලේකම් පුහුණුකරු සහ කණ්ඩායම් නායකයාගෙන් සමන්විත විය යුතුය.

(14) <u>බන්ධනාගාර වර්ණ ප්‍රධාන කමිටුව</u>

14.1 වර්ණ ප්‍රධාන කමිටුව නිලධාරීන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර මෙම කමිටුව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබයි.

14.2 බන්ධනාගාර වර්ණ ප්‍රධාන කමිටුවේ කාර්ය භාරය :- අදාල වර්ෂයේ වර්ණ ලබාදීම සඳහා සුදුසු ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගැනීම.

(15) <u>විනය කමිටුව</u>

විනය කමිටුව සමන්විත විය යුත්තේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් නම් කරන උප සභාපතිවරයෙකු සහ අදාල ක්‍රීඩා කමිටුවේ සභාපති හා ලේකම්ගෙන් ද බන්ධනාගාර ක්‍රීඩා සමාජයේ ප්‍රධාන ලේකම්ගෙන් ද විය යුතුය.

15.1 <u>විනය කමිටුවේ කාර්යයභාරය</u>

(අ) ක්‍රීඩකයින්ගේ විනය මනා ලෙස පවත්වාගෙන යෑමට අවශ්‍ය විධිවිධාන යෙදීම.

(ආ) විනය කඩකිරීම් සිදුවන අවස්ථාවලදී ඊට අදාලව ගතයුතු නීත්‍යානුකූල පියවරන් කඩිනමින් රැගෙන ක්‍රීඩාවේ ගෞරවය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.

(16) <u>භාණ්ඩාගාරිකගේ කාර්යභාරය</u>

(අ) ක්‍රීඩා සමාජයට ලැබෙන සියළුම මුදල් සහ සියළුම වියදම් පිළිබඳව සත්‍ය ගිණුම් ඔහු විසින් පවත්වා ගත යුතුය.

(ආ) ඔහු විසින් නියමාකාරයෙන් විගණනය කරන ලද ලාභ අලාභ ගිණුම සහ ශේෂ පත්‍රය මධ්‍යම කමිටු රැස්වීමේදී සෑම අවුරුද්දකම පෙබරවාරි මස ඉදිරිපත් කල යුතුය. මෙම ගිණුම් වාර්තාව ජනවාරි 01 සිට දෙසැම්බර් මස 31 දක්වා විය යුතුය.

(ඇ) භාණ්ඩාගාරික විසින් සෑම මසක් අවසානයේම මධ්‍යම කමිටු රැස්වීමේදී පසුගිය මසට අදාල ගිණුම් වාර්තාවක් ඉදිරිපත් කල යුතුය.

(17) <u>මූල්‍ය, බැංකු කටයුතු සහ ආයෝජන</u>

(අ) ක්‍රීඩා සමාජයේ මූල්‍ය වර්ෂය වනුයේ සාමාන්‍ය කැලැන්ඩර් වර්ෂයයි.

(ආ) ක්‍රීඩා සාමාජයට අයිති සියළුම මුදල් බැංකුවේ තැන්පත්කල යුතු අතර එම තැන්පතු මධ්‍යම කමිටුව විසින් අනුමත කල යුතුය. සියළුම ගෙවීම් හැකිතාක් චෙක්පත් මගින් සිදු කල යුතුය.

(ඇ) සෑම චෙක්පතක්ම පුද්ගලයින් දෙදෙනෙකු අත්සන් කල යුතු අතර එක් අත්සනක් A කාණ්ඩයේ සහ අනෙක් අත්සන් B කාණ්ඩයේ විය යුතුය.

A කාණ්ඩය :- සභාපති ( සභාපති නොමැති විට ජ්‍යෙෂ්ඨ උප සභාපති)

B කාණ්ඩය :- ගරු භාණ්ඩාගාරික

(18) <u>ක්‍රීඩා පිටියභාර ලේකම්වරයාගේ කාර්ය භාරය</u>

18:1 බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රීඩා සමාජයේ ක්‍රීඩා පිටිය භාර ලේකම්වරයා, බන්ධනාගාර ක්‍රීඩා පිටිය නඩත්තු කිරීම, එහි ක්‍රීඩාගාරය නඩත්තු කිරීම, අවන්හල නඩත්තු කිරීම සහ පවත්වා ගෙන යාම කල යුතුය.

18:2 බන්ධනාගාර ක්‍රීඩාපිටිය කුලියට දීමේදී අයකරන මිල පිළිබඳ මධ්‍යම කමිටුව තීරණය කල යුතු අතර ක්‍රීඩා පිටියභාර ලේකම් විසින් ක්‍රීඩා පිටිය බදුදීම පිළිබඳව සියළුම කටයුතු සිදු කල යුතු අතර අවශ්‍ය කාරණා සඳහා මධ්‍යම කමිටුව වෙතින් උපදෙස් පැතිය යුතුය.

(19) **සමාජයේ අරමුදල** : සමාජයේ අරමුල මාසික සාමාජික මුදල් හා ප්‍රාදේශීය සංගම් වලින් ලැබෙන මාසික දායක මුදල් වලින් සමන්විතය.

19:1 <u>සමාජික මුදල්</u>
සියළුම සමාජිකයින්ගෙන් මාසිකව රු 50 ක මුදලක් සාමාජික මුදල් වශයෙන් අයකරනු ලබන අතර එම මුදලින් තුනෙන් දෙකක් (2/3) මව් සංගමයට ද ඉතිරි තුනෙන් එකක මුදල සාමාජිකයා සේවය කරන ආයතනයේ ප්‍රාදේශීය සංගමයේ ගිණුමට ද බැර කල යුතුය.

19:2 සියළුම බන්ධනාගාර ආයතනවල ආපනශාලා මව් සංගමය යටතේ ඇති ප්‍රාදේශීය සංගම් මගින් සිදුකල යුතු අතර එම ආපනශාලා වලින් මාසිකව ලැබෙන ශුද්ධ ලාභයෙන් 10% ක මුදලක් මව් සංගමය වෙත මාසිකව බැර කල යුතුය.

19:3 සාමාජික මුදල් හෝ ප්‍රාදේශීය සංගම්වල දායක මුදල් සංශෝධනය කරන්නේ නම් එය විධායක කමිටුවේ නිර්දේශය මත මහා සභාවට තීරණය කිරීමේ බලය ඇත.

(20) **විගණනය** : විධායක සභාව විසින් හෝ මහා සභාව විසින් තීරණය කරන්නේ නම් ගිණුම් පිළිබඳ දැනුම ඇති නිළධාරීන් දෙදෙනෙකු මගින් හෝ ලියාපදිංචි බාහිර ආයතනයක් මගින් සාමාජයේ ගිණුම් විගණනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකල හැක.

(21) **බලය පැවරීම** : විධායක කමිටුව හෝ මධ්‍යම කමිටුව මගින් ඔවුන්ගේ බලය, ඔවුනට සුදුසුයැයි හැගෙන සාමාජිකයෙක් හෝ සාමාජිකයින් සිටින උප කමිටුවකට පැවරිය හැකිය. ඕනෑම උප කමිටුවක් වෙත පවරනු ලැබූ එම බලය පවතින කාලය සහ එහි ක්‍රියාකාරීත්වය එම අදාල විශේෂ කටයුත්ත පවතින කාලය සඳහා බලපවත්වනු ඇත.

(22) **අවම සාමාජික සංඛ්‍යාව** : වාර්ෂික මහා සභා රැස්වීමට හෝ විශේෂ සභා රැස්වීම හෝ අවම සාමාජිකයින් 50 ක් සහභාගිවිය යුතු අතර විධායක කමිටු රැස්වීමක් සඳහා අවම සාමාජිකයින් 05 දෙනෙකු සහභාගිවිය යුතුය. තවද මධ්‍යම කමිටු රැස්වීමක් සඳහා අවම සාමාජිකයින් 10 දෙනෙකු සහභාගි විය යුතුය.

(23) **වාර්ෂික මහා සභා රැස්වීම** : වාර්ෂික මහා සභා රැස්වීම සෑම අවුරුද්දකම මාර්තු 31 වැනිදාට පෙර පැවැත්විය යුතු අතර මෙම රැස්වීම පිළිබඳ සාමාජිකයින් වෙත කරනු ලබන දැන්වීම් ගරු ලේකම් විසින් මසකට පෙර සිදු කල යුතුය. මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රය, විගණනය කරන ලද ගිණුම් වාර්තාවේ පිටපතක්, පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සහ සියළුම ක්‍රීඩාවල ලේකම්වරුන්ගේ ප්‍රගති වාර්තාවේ පිටපතක් ද අවම වශයෙන් සති දෙකකට පෙර සාමාජිකයින් අතර බෙදා හැරිය යුතුය.

(24) <u>කමිටු රැස්වීම</u>

(අ) මධ්‍යම කමිටුව මසකට වරක් රැස්විය යුතු අතර මෙම රැස්වීම සඳහා සෑම ආයතනයකින්ම නියෝජිතයෙකු සහභාගි කරවීම අනිවාර්යය වේ.

(ආ) විධායක කමිටුව ගරු සභාපතිගේ නියමයෙන් ඕනෑම අවස්ථාවක රැස්විය හැක.

(ඇ) විශේෂ මහා සභා වාරයක් කැඳවිය හැක්කේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ කැඳවීමකින් පමණි.

(25) <u>සංශෝධන</u> : සංශෝධන පිළිබඳ යෝජනා ගරු ප්‍රධාන ලේකම් වෙත අදාල රැස්වීමට අවම වශයෙන් සති දෙකකට පෙර ලැබිය යුතු අතර එම සංශෝධන පිළිබඳ ක්‍රියාකරනුයේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අවසරයෙන් පමණි.

(26) <u>සාමාජිකයින් සඳහා ප්‍රතිලාභ</u>

26:1 සාමාජිකයින් ඉදිරිපත්වන ජාත්‍යන්තර තරඟයකදී විධායක කමිටුවේ තීරණය පරිදි යම් දායක මුදලක් හෝ ණය ප්‍රදානයක් ලබා ගැනීම සඳහා සාමාජිකයින්ට අවස්ථාව ඇත.

26:2 සාමාජිකයින් සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා ගැනීම වෙනුවෙන් සහණ ක්‍රමයට ණය මුදලක් විධායක කමිටුවේ තීරණය පරිදි ලබාදිය හැක.

(27) <u>ප්‍රාදේශීය සංගම් / අනු සංගම්</u>

27:1 බන්ධනාගාර ආයතන විසින් පිහිටුවාගන්නා ප්‍රාදේශීය සංගම් විධිමත් ලෙස ව්‍යවස්ථාවක් සම්මත කරගෙන පිහිටුවා තිබිය යුතුය. එම සංගම්වලට ස්වාධීනව කටයුතු කළ හැකි අතර සංගම් මගින් ආයතනයේ නිළධාරීන්ගේ ක්‍රීඩා කටයුතු හා සුභසාධන කටයුතු සිදු කිරීමට ද කටයුතු කළ යුතුය. එසේම ගිණුම් වාර්තා නිසි ලෙස පවත්වා ගත යුතුය.

27: 2 ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ආපන ශාලා, නිවාඩු නිකේතන හෝ වෙනයම් ආදායම් උපයන ක්‍රියාකාරකම් පිළිබඳව මව් සංගමය දැනුවත් කළ යුතුය.

27:3 එසේම ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා පිහිටුවා ගෙන ඇති අනු සංගම් වෙතොත් ඒවායේ ගිණුම් වාර්තා වාර්ෂිකව මව් සංගමය වෙත ඉදිරිපත් කළ යුතුය.

27:4 ප්‍රාදේශීය සංගම් වල ගිණුම් කටයුතු හෝ අනෙකුත් කටයුතු පිළිබඳව පරීක්ෂා කිරීමට විධායක කමිටුවේ තීරණය මත බලය ලබා දෙන නිළධාරියෙකුට හැකියාව ඇත.

(28) <u>වෙනත්</u>

28:1 පිටත පුහුණුකරුවන්ගේ සේවය ලබාගන්නේ නම් ඒ සඳහා විධායක කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය.

28:2 සාමාජිකයින් විසින් ඉදිරිපත්වන තනි පුද්ගල ක්‍රීඩා ඉසව් ඇත්නම් එම තරඟ සඳහා සහභාගිවීමට පෙර විධායක කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය.

සංශෝධනය කරන ලද ව්‍යවස්ථාව 2022.05.22 වන දින පැවති මහා සභා රැස්වීමේදී අනුමත කරන ලදි

චන්දන ඒකනායක
බන්ධනාගාර කොමසාරිස් (පාලන)
ප්‍රධාන ලේකම්,
බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රීඩා හා විනෝද සමාජය

චන්දන ඒකනායක
බන්ධනාගාර කොමසාරිස් (පාලන)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

එච්.එම්.ටී.එන්.උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
සභාපති,
බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රීඩා හා විනෝද සමාජය

එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.